අධ්‍යාපන අමාත්‍යාංශය
கல்வி அமைச்சு
Ministry of Education

'ඉසුරුපාය', බත්තරමුල්ල, ශ්‍රී ලංකාව.
'இசுருபாய', பத்தரமுல்ல, இலங்கை.
'Isurupaya', Battaramulla, Sri Lanka.
+94112785141-50 | +94112785818
info@moe.gov.lk | www.moe.gov.lk


මගේ යොමුව / எனது இல. / My Ref. ED/1/1/6/1

ඔබේ යොමුව / உமது இல. / Your Ref.

දිනය / திகதி / Date 2020.02.18

චක්‍රලේඛ අංකය - 11/2020

පළාත් අධ්‍යාපන ලේකම්වරුන්,
පළාත් අධ්‍යාපන අධ්‍යක්ෂවරුන්,
කලාප අධ්‍යාපන අධ්‍යක්ෂවරුන්,
කොට්ඨාස භාර නියෝජ්‍ය / සහකාර අධ්‍යාපන අධ්‍යක්ෂවරුන්,
පරිවෙනාධිපති හිමිවරුන්,
පාසල් විදුහල්පතිවරුන්,

................................................................................

## සමස්ත ලංකා පාසල් ළමා චිත්‍ර තරගය - 2020

අධ්‍යාපන අමාත්‍යාංශයේ සෞන්දර්ය ශාඛාවෙන් වාර්ෂිකව සංවිධානය කරනු ලබන උක්ත තරගය හා සම්බන්ධ මෙම චක්‍රලේඛයෙහි දැක්වෙන නියමයන්ට අනුකූලව තරග පැවැත්වීමට සියලුම රජයේ හා පෞද්ගලික පාසල්වල විදුහල්පතිවරුන් ද, සියලුම පරිවෙනාධිපති ස්වාමීන්වහන්සේලා ද, ජාත්‍යන්තර පාසල්වල විදුහල්පතිවරුන් ද, දැනුවත් කරන ලෙස මෙයින් දන්වමි.

චක්‍රලේඛයෙහි දැක්වෙන ආකාරයට අදාළ තරග සංවිධානය කර කලාප තරග ප්‍රතිඵල 2020.04.26 දිනට පෙර පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව වෙතද, පළාත් විනිශ්චයේ ප්‍රතිඵල 2020.05.30 දිනට පෙර අධ්‍යාපන අමාත්‍යාංශයේ සෞන්දර්ය ශාඛාව වෙත ද එවීමට කටයුතු කළ යුතුවේ. සමස්ත ලංකා අවසාන තරග 2020.07.12 පැවැත්වීම සඳහා තරග සංවිධානය පිළිබඳ ඉදිරි කටයුතු අධ්‍යාපන අමාත්‍යාංශයේ සෞන්දර්ය අධ්‍යාපන ශාඛාවෙන් සිදු කරනු ලැබේ.

මෙම වසරේදී ද සියලුම පාසල් කේන්ද්‍ර කර ගනිමින් තරග වයස් කාණ්ඩ 16 ක් හා නිර්මාණ තරග අංශ 43 ක් යටතේ මෙම තරගය පවත්වනු ලබයි. එනම් 1-11 ශ්‍රේණි සඳහා තරග අංශ 15 ක් ද, 12-13 ශ්‍රේණි සඳහා තරග අංශ 19 ක් ද, විශේෂ සිසුන් සඳහා වයස් කාණ්ඩ 09 යටතේ තරග අංශ 09 ක් ද වශයෙනි.




ගරු අමාත්‍යතුමා / கௌரவ அமைச்சர் / Hon. Minister
+94112784832
+94112784825
minister.education@moe.gov.lk

ලේකම් / செயலாளர் / Secretary
+94112784811
+94112785162
secretary.education@moe.gov.lk